**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - 2015**

-----------------------------------------------------------

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 56 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය ව්‍යාචනය**

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

(i) මූල්‍ය ප්‍රකාශනවල ගණුදෙනු හා සිද්ධීන් වාර්තා කිරීමේදී උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවත් දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙන ආදායම්, මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ii) වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් ඉඩම් විකුණුම් මුළු ආදායම වූ රු. 213,499,139 ක මුදල මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ ද විසර්ජනය කළ යුතු කොටස සංචිත යටතේ ද දක්වනු වෙනුවට ඉන් සියයට 60 ක ප්‍රමාණය වූ රු.128,099,483 ක් ආදායම් යටතේ ද ඉතිරි සියයට 40 වන රු.85,399,656 ක් සංචිත යටතේද දක්වා තිබුණි. ඒ අනුව ලැබුණු ආදායම්හි නියම ස්වරූපය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

පසුගිය වර්ෂ කිහිපයකට අදාළව බදු ඉඩම් වලින් හා 1995 වර්ෂයට පෙර ගෙවන ලද පාරිතෝෂික ඇතුළු අනෙකුත් දීමනා ප්‍රතිපූර්ණය කිරීමෙන් ලැබූ එකතුව රු.13,666,001 ක ආදායම අතීතානුයෝගීව ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂ ගැලපීම් ලෙස වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08**

ඉඩමක අයිතිය ලබාගැනීම සඳහා සභාවට එරෙහිව පවරන ලද නඩුවක පැමිණිලිකරුවන් වෙත රු.148,715,363 ක් ගෙවීමට 2009 වර්ෂයේදී අභියාචනාධිකරණය තීන්දුවක් ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට ඊට අදාල පොළියද සමඟ ගෙවිය යුතු මුදල රු.200,000,000 ක් ඉක්මවා තිබුණද ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අස්ථිත්වයක් විසින් නැවත විකිණීම සඳහා තබාගෙන ඇති ඉඩම් හා දේපල තොග ලෙස දැක්විය යුතු වුවත් විකිණීම සඳහා ඇති රු. 676,169,345 ක් වටිනා ඉඩම් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ii) විකිණීම සඳහා ඉහත දක්වා ඇති ඉඩම් මුල් වරට 1978 වර්ෂයේ තක්සේරු කර තිබූ අතර 2003 සහ 2006 වසරේදී කරනු ලැබූ සුළු ගැලපුමක් හැරුණු කොට 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාම එකම වටිනාකමක් ලෙස දක්වා තිබුණි. මේ අනුව වර්ෂයක් පාසා සිදු කෙරෙන අත්පත් කර ගැනීම්, විකුණුම් ආදිය ගැලපීමෙන් පසු තවදුරටත් ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහාද ගැලපුම් නොකිරීම් හේතුවෙන් නිවැරදි වටිනාකමක් මෙම ශේෂ වලින් නිරූපනය නොවන බව නිරීක්ෂණය විය.

## 2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බදු කුලී ගෙවීමේ ප්‍රමාදය මත අයවිය යුතු අධිභාර රු.3,602,498 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) සභාව විසින් බදු දී තිබුණු ඛනිජ සම්පත් වලින් (කළුගල් වලින්) අයවිය යුතු හිඟ ආදායම් පිළිබඳව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර කලුතර දිස්ත්‍රික්කයෙන් පමණක් අයවීමට තිබු හිඟ කළුගල් ආදායම රු.20,152,185 ක් විය.

(ඇ) සේවා කාලය වසර 1 සිට වසර 5 දක්වා වූ සේවකයන් 7 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදනය රු.228,745 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.3. **පැහැදිලි නොකල වෙනස්කම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වන්දි අවිනිශ්චිත 1 සහ 2 අදියර යටතේ සමස්ත වගකීම රු.223,012,958 ක් වුවද තක්සේරු හා වන්දි අංශයේ වාර්තා අනුව ප්‍රකාශකයින් වෙත ගෙවීමට තිබු පොලී මුදල් සහිත වන්දි මුදල රු.586,300,000 ක් විය. ඒ අනුව රු.363,287,042 ක වෙනසක් නිරීක්ෂණය වුයෙන් මෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආදායම් ශීර්ෂ 11ක ආදායම් ඊට සම්බන්ධ ආදායම් වාර්තා සමඟ සැසඳීමේදී රු.17,891,944 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ආදායම් අංශයේ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු කුලී ආදායම රු.171,128,621 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.87,915,051 ක් ලෙස දැක්වීමෙන් බදු කුලී ආදායමේ රු.83,213,570 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 10 කට අධික කාලයක සිට රාජ්‍ය ආයතන 7 කින් අයවිය යුතු රු.2,132,372,712 ක්, වසර 1 සිට වසර 5 දක්වා කාලයක සිට සේවකයන් 46 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.748,589 ක් හා වසර 2 කට අධික කාලයක සිට අයවිය යුතු බදු කුලී රු.87,915,051 ක් අයකර ගැනීමට හෝ ගිණුම් වලින් නිරවුල් කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත්වී තිබුණි.

(ආ) ඉඩම් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සභාපතිගේ අනුමැතිය ඇතිව අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබූ රත්නභූමි ඔප්පු ප්‍රදානය වැඩසටහනේ ප්‍රචාරක කටයුතු සැලසුම් කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2003 වර්ෂයේදී රු.3,252,654 ක මුදලක් ගෙවා තිබුණි. වර්ෂ 12 ක් තිස්සේ අයවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෙම මුදල සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 1999 වර්ෂයේ සිට විවිධ ණයගැතියන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,921,575 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදීද අයවී නොතිබුණු අතර එම වටිනාකම තහවුරු කිරීමට අදාළ මූලාශ්‍ර ලියවිලි සභාව සතුව නොතිබුණි.

(ඇ) වසර 10 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.6,424,700 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම්ද, වසර 08 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.3,923,492 ක් වූ සේවකයින්ට ඉඩම් විකුණුම් අත්තිකාරම් ද, වසර 10 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින රු.11,215,850 ක බදු කුලී අත්තිකාරම් හා වසර 4 ක කාලයක සිට පැවත එන රු.2,500,000 ක ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වටිනාකම රු.201,500 ක් වූ අතර ඉන් රු.66,000 ක් වසර 2 ත් 10 ත් අතර දක්වා වූ අතර ඉතිරි රු 135,500 ක ශේෂය වර්ෂ 10 ට වැඩි කාලයක සිට පැවත එන බව නිරීක්ෂණය විය. තවද රු.800,130 ක් වටිනා වසර 10 කට අධික කාලයක් පැවතෙන විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ගෙවිය යුතු තැන්පත් පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගනුදෙනු සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂය | ශේෂය රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් | 676,169,345 | ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන/ උපලේඛන |
| ගොඩනැගිලි | 4,586,223 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පරිගණක හා උපාංග | 7,771,227 | |
| ලිබඩු හා සවිකිරීම් | 857,543 | |
| මෝටර් රථ | 68,571,828 | |
| කාර්යාල උපකරණ | 20,977,190 | |
| සුභ සාධන උපකරණ | 1,031,996 | |
| ලිපිද්‍රව්‍ය තොග | 2,711,069 | |
| වන්දි අවිනිශ්චිත ගිණුම | 223,012,958 | විස්තරාත්මක උප ලේඛන |

## 2. 5. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතී රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2014 දෙසැම්බර් 18 දිනැති අංක 12/ 1237/ 501/ 030 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | 2002 ජනවාරි 01 දින සිට 2004 මාර්තු 31 දින දක්වා කාලය තුළ සභාව විසින් අන්සතු කරන ලද ඉඩම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබූ කරුණු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් මාස 2 ක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස නම් කරනු ලැබූ නිලධාරින් සිව් දෙනෙකු ගෙන් සමන්විත කමිටුවක් පත් කල යුතු වුවද එය සිදු කර නොතිබුණි. |
| (ආ) 2004 ජුලි 29 දිනැති අංක 25 හා 2004 අගෝස්තු 10 දිනැති අංක 25 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) ආයතනය විසින් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2004 වර්ෂයේ සිට රු.1,228,664,542 ක් ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.<br>(ii) මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක රු.7,000,000 ක මුදලක් 2010 දෙසැම්බර් 30 දින ආයෝජනය කර තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.2. වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යවසායක්ම තම ආයතනික මෙහෙයුම් සහ ක්‍රියාකාරී කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ මෙහෙයවීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද, සභාව විසින් මෙම කළමනාකරණ කමිටු පත්කර නොතිබුණි. |
| (ඈ) 2000 දෙසැම්බර් 08 දිනැති අංක 2000/ 26 දරන පරිහරණ ගාස්තු අය කිරීම සම්බන්ධ අභ්‍යන්තර චක්‍රලේඛයේ 3 වගන්තිය | ඉඩම් අනවසර පරිහරණය කරන්නන්ගේ නාම ලැයිස්තුවක් දිස්ත්‍රික් කාර්යාල විසින් සකස් කල යුතු අතර, එහි පිටපතක් අධ්‍යක්ෂ (පාලන) වෙත එවිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. |
| (ඉ) 2008 අප්‍රේල් 17 දිනැති අංක 2008/ පොදු /1 දරන කොමිෂන් සභා චක්‍රලේඛය.<br>(i) 1 (i) සහ (ii) වගන්තිය | අදාළ වර්ෂය සඳහා හිඟ පරිහරණ ගාස්තු එම වසර තුළදීම අයකර අවසන් කල යුතු වුවත්, බොහෝ අවස්ථාවලදී ඉඩම් විකිණීමේදී පරිහරණ ගාස්තු අයකිරීම සිදු කර තිබුණි. |

(ii) 2 වගන්තිය

2001 ඔක්තෝබර් 10 දිනට පෙර සභාව සතු ඉඩම් අනවසරයෙන් භුක්ති විඳින හා පදිංචිව සිටින පුද්ගලයන්ගෙන් අය කල යුතු සියලු හිඟ අනවසර පරිහරණ මුදල් නොපමාව අය කර අවසන් කල යුතු බව දක්වා තිබුණද එසේ කර නොතිබුණි.

(ඊ) 2007 සැප්තැම්බර් 12 දිනැති අංක 2007 / 15 දරන අභ්‍යන්තර චක්‍රලේඛය

දීර්ඝ කාලයක් අනවසරයෙන් භුක්ති විඳින සභාව සතු ඉඩම් මැන වෙන් කිරීමෙන් පසු, තක්සේරු කර, කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව බදු ඔප්පු මගින් ලබාදිය යුතු බව දක්වා තිබුණද 2015 වසර වන විටද අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් විශාල සංඛ්‍යාවක් පැවතුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 55,708,450 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.87,130,484 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.31,422,034 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ස්ථාවර තැන්පත් , භාණ්ඩාගාර බිල්පත් සහ සාමාන්‍ය ඉතුරුම් පොළී ආදායම් රු.36,664,274 කින් පහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවති නමුදු 2012 වර්ෂයෙන් පසුව ක්‍රමයෙන් අතිරික්තයේ අඩුවීමක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකීමේදී කොමිෂන් සභාවේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2015 දක්වා පිළිවෙලින් රු. 199,448,723, රු.282,011,837, රු.269,283,725, රු. 284,277,810, රු.269,448,792 ක් විය. ඒ අනුව 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී දායකත්වයේ ඉහළ යාම සියයට 41 ක් වී තිබුණද ඊට පසු වර්ෂ වලදී ඒ මට්ටමින් පවත්වා ගෙන යාමට අපොහොසත්වී තිබුණි.

**3.2 සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි.**

--------------------------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව හා සභාව විසින් අධිකරණ 09 ක පවරා ඇති නඩු 503 ක් විභාග වෙමින් පැවතුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1. කාර්යසාධනය**

-----------------

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 2 වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකුට අයිති උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම්, එම තැනැත්තන් අයිතිව තබා නොගැනීම සුරක්ෂිත කිරීම, පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම්වලින් ඇතිවන රැකීරක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය දෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම සභාවේ මූලික අරමුණ වේ. සභාවේ අරමුණු ඉටු කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංවර්ධනය සඳහා සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් ලේඛණයක් නොතිබීම හේතුවෙන් නිවැරදි තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි.

2016 මාර්තු 23 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමට ඉදිරිපත් කෙරුණු තොරතුරු අනුව සභාවේ ඉඩම් විකුණුම් සහ බදු දුන් ප්‍රමාණයන් ක්‍රමක්‍රමයෙන් අඩු වී තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව එය සියයට 73 කින් අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාල ගැසට් නිවේදන පළ කරන ලද හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 106 ක් වර්ෂය ආරම්භයේ පැවතුණ ද සමාලෝචිත වර්ෂය තුළදී වන්දී ගෙවීමට හැකිව තිබුනේ ලිපිගොනු 2 ක් සඳහා පමණක් විය. තවදුරටත් ලිපිගොනු 550 කට ආසන්න ප්‍රමාණයක තොරතුරු ලබා ගත යුතුව තිබෙන බවද නිරීක්ෂණය විය.

**4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) කාලවිලවත්ත ඉඩමේ කැබලි අංක 4 භුක්ති විඳින බදු ගැණුම්කරු විසින් එම ඉඩම 2002 වසරේ වෙළඳ වටිනාකම මත මිලට ගැනීමට එකඟ වී තිබියදී ඒ පිළිබඳ ප්‍රමාණවත් පියවර නොගැනීම නිසා අදාළ පුද්ගලයා වර්ෂ 20 කට අධික කාලයක් බදු ගෙවීමකින් තොරව ඉඩම භුක්ති විඳ තිබුණි.

(ii) පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව සංවර්ධනය නොකරන ලද ඉඩම් නැවත පවරා ගැනීමට ක්‍රියාකල යුතු වුවද බදුකරු විසින් වර්තමානයේ භුක්තියේ නොසිටි හා ඉඩමේ කිසිදු සංවර්ධන කටයුත්තක් නොකළ කාලවිලවත්ත ඉඩමේ කැබලි අංක 5 සහ 7 කොටස් නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) මෙම ඉඩමේ අනවසරකරුවන් ව්‍යාජ ඔප්පු සකසා භුක්තියේ සිටින අතර ඔවුන්ට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියාකිරීමට හෝ 1975 අංක 39 දරන සංශෝධන පනතේ 42 (ඇ) හි 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව අනවසරකරුවන් ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) පනතේ 33 වගන්තිය ප්‍රකාරව හිමිකම් තහවුරු වී ඇති යම් තැනැත්තෙකුට ගෙවිය යුතු යම් වන්දියක් ඔහු විසින් නොපිළිගන්නා ලද අවස්ථාවක හෝ, ඒ තැනැත්තා මියගොස් ඇති විට හෝ, ඔහු ගැන සොයාගැනීමට නොහැකි අවස්ථාවක වන්දිය හිමි තැනැත්තන් විසින් ලබා ගැනීම සඳහා සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක තැන්පත් කළයුතුය. එසේ වුවද ලිපිගොනු 127 කට අදාළව මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට විගණිත දිනය වූ 2016 අප්‍රේල් 30 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) වන්දි අවිනිශ්චිත (II) ගිණුමෙන් වන්දි ගෙවිය යුතු පුද්ගලයන් නිශ්චිතව හඳුනා නොගැනීම නිසා වර්ෂ ගණනාවක සිට වන්දි නිරවුල් කිරීමක් සිදු වී නොතිබුණු අතර රු. 109,959,493 ක් වූ ශේෂය වර්ෂ ගණනාවක් පුරා නොවෙනස්ව පැවතුණි.

**4.3.** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 අප්‍රේල් 02 දිනැති අංක 6873 දරන කොමිෂන් පත්‍රිකාව අනුව ස්කන්ද කුමාර කෝවිල වෙත බදු පදනම මත ලබා දුන් අක්කර 04 රූඩ් 02 පර්චස් 05 ක බිම් ප්‍රමාණය සඳහා 1978 වර්ෂයේ සිට තක්සේරු කර බදු මුදල් අය කිරීමට කටයුතු කල යුතු වුවද, වර්ෂ 35 කට අධික කාලයක සිට සභාව සතු මෙම ඉඩමෙන් කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි.

(ආ) සභාව විසින් බදුදීම අවලංගු කරනු ලැබූ ඇතැම් ඉඩම් අනවසර පදිංචි කරුවන් විසින් පරිහරනය කරනු ලබන අතර, එම ඉඩම් වලින් කිසිදු ආදායමක් සභාවට ලැබී නොතිබුණි.

**4.4.** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු.**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දීර්ඝකාලීන බදු පදනම මත නුගේදොලවත්ත ඉඩමෙන් අක්කර 4 රූඩ් 2 පර්චස් 16.96 ක වපසරියකින් යුත් කොටසක් 30 අවුරුදු බදු පදනම මත මිශ්‍ර භෝග හා පලතුරු වගාවක් සඳහා ලබා දී තිබුණු නමුත්, එහි බර වාහන පැදවීම පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යන බවට ක්ෂේත්‍ර පරීක්ෂාවක් මගින් තහවුරු කර තිබුණි. ඒ අනුව 2002 මැයි 23 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2/ 1/ 145 (iii) හි 13 වන වගන්තිය ප්‍රකාරව ඉඩම ලබා ගැනීමේ පරමාර්ථයෙන් බැහැර වීම මත පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බවත් පදනම් වෙනසකට අනුව බදු රේටයන් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) පින්නලන්ද වත්ත ඉඩමෙන් පිඹුරු අංක 53 හි කැබලි අංක 1 හා 2 හි අක්කර 16 රූඩ් 0 පර්චස් 22 ක ප්‍රමාණයක් අලි අනාථාගාරයක් පවත්වාගෙන යාම සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත බදු දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව තාවකාලිකව තීරණය කල බදු මුදලක් අයකර 1974 වසරේ සිට රඹුක්කන උපදිසාපති වෙත භාරදී ඇති මෙම ඉඩම 2008 දෙසැම්බර් 18 දිනැති 587 වැනි කොමිෂන් සභා වාරයේ කොමිෂන් පත්‍රිකා අංක 6751 ට අනුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත 2009 වර්ෂයේ සිට වසර 30 ක කාලයක් සඳහා බදු දීමට නිර්දේශ කර තිබුණද, ඊට අදාළ පැවරුම් ඔප්පු හෝ බදු ගිවිසුම් කිසිවක් සකස්කර නොතිබුණි.

(ii) 1974 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා නව තක්සේරුව අනුව හිඟ බදු ශේෂය ලෙස රු. 6,178,731 ක් දක්වා තිබුණු අතර පැවරුම් ඔප්පුවක් හෝ බදු ගිවිසුම් ඔප්පුවක් නොමැති වීම මත එම හිඟ ශේෂය අයකර ගැනීම වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ගයකට යොමු වීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

මෙහිදී සත්වෝද්‍යානය රජයේ ආයතනයක් වන බැවින් බදු පදනම මත ලබාදීම නිත්‍යානුකූල නොවන බැවින්ද, මෙතෙක් බදු පදනම මත ලබාදුන් නමුත් මුදල් නොගෙවීම නිසාද, සාකච්ඡාවකට කැඳවා, ගත් තීරණය අනුව 2017 වර්ෂයේදී අයවැයෙන් මුදල් ප්‍රතිපාදන ලබාගෙන සභාවට වන්දි ලබාදීමේ පදනම මත අත්පත්

කර ගැනීමෙන් පවරා දීමට පියවර ගෙන ඇති බවත් සභාපතිවරයා විසින් විගණනයට දන්වා තිබුණි.

(ඇ) කෑගල්ල පින්නවල වත්තේ පේෂකර්ම දෙපාර්තමේන්තුව වෙත රූඩ් 02 ක ඉඩමක් පවරා තිබුණු නමුත් ඊට අදාළවද කිසිදු නීතිමය ලියවිල්ලක් සකස් කර නොතිබුණි.

**4.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------------

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වේවැල්තලාව වත්ත ඉඩමේ අක්කර 23 රූඩ් 03 පර්චස් 15 ක් 2004 මාර්තු 18 දින සිට විගණන දිනය වූ 2015 දෙසැම්බර් 31 දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

**4.6. හඳුනාගන්නා ලද පාඩු**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාලවිලවත්ත කැබලි අංක 09 හෝටල් සමාගමක් විසින් භුක්ති විඳීම සම්බන්ධයෙන් සිදු කල භෞතික විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 වර්ෂයේදී බේරුවල නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා ඒකාබද්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබූ අතර ඊට හෝටල් ව්‍යාපෘතියක්ද ඇතුළත්ව තිබුණෙන් එය ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා පෞද්ගලික කල්බදු සමාගමක් ගිවිසුම් ගතව තිබුණි.

(ii) පෞද්ගලික කල්බදු සමාගම ඉඩම පවරා ගන්නා අවස්ථාව වන විට පෞද්ගලික හෝටල් සමාගමක් වර්ෂ 30 කට අධික කාලයක් අනවසරයෙන් හෝටලයක් පවත්වාගෙන ගොස් තිබුණ ද සභාව ඊට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) පෞද්ගලික සමාගමක් වෙත ලේලන්ඩ් වත්ත කර්මාන්තපුරයෙන් අක්කර 06 ක ඉඩමක් පනස් අවුරුදු බද්දට 2005 සැප්තැම්බර් 09 දින සිට ලබාදී තිබීම සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2012 මාර්තු 28 දිනැති අංක 7931 දරන කොමිෂන් සභා පත්‍රිකාව අනුව වසර 5 කට වරක් බදු සංශෝධනය කර බදු ආදායම් රැස්කර ගැනීම් කල යුතු වුවද, මෙම සමාගමේ ඊලඟ වසර 5 සඳහා කලින් නියම කල මුදලට සියයට 50 ක් එකතු කර බදු නියම කලද එම මුදල ගෙවීමට සමාගම එකඟ වී නොතිබුණි.

(ii) ආයතනයේ පාලන චක්‍රලේඛ 2005/07 පරිදි ගෙවීම ප්‍රමාද වීම වෙනුවෙන් සියයට 10 ක දඩ මුදලක් අයකල යුතු වුවද එසේ සිදු කර නොතිබුණු අතර අහිමි වූ මුදල රු.960,000 ක් විය.

(iii) සභාව විසින් කෘෂිකාර්මික ඉඩම් බදු දීමේදී තක්සේරු වටිනාකමින් සියයට 4 ක බදු ප්‍රතිශතයකුත්, කාර්මික අංශයෙන් සියයට 6 ප්‍රතිශතයක්ද අය කිරීම සභාවේ සමාන්‍ය ක්‍රියාවලිය වුවද කාර්මික අංශයට අදාල වූ මෙම ආයතනයෙන් සියයට 4 ක ප්‍රතිශතයක් පමණක් අය කර තිබුණි. මේ හේතුවෙන් 2015 වර්ෂය දක්වා රු.8,000,000 ක් අඩුවෙන් අයකර තිබුණි.

(ඇ) මාදම්පේ දිස්ත්‍රික් ඉඩම් බල ප්‍රදේශයට අයත් දවුල්කුරුදුවත්ත ඉඩමේ පවත්වාගෙන යන පොල් වගාවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.306,850 ක ආදායමක් ලැබී තිබුණද මුරකරු දීමනා සහ වෙනත් වියදම් වශයෙන් එකතුව රු. 445,397 ක් දරා තිබීම හේතුවෙන් හා රු.138,547 ක පාඩුවක් සිදුවී තිබුණි.මේ අනුව සභාව යටතේ පාලනය වන මෙවැනි ඉඩම් තවදුරටත් සංවර්ධනය කර ලැබෙන ආදායම් වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 4.7. කාර්යමණ්ඩල පරිපාලනය

--------------------------------

සභාවේ අධ්‍යක්ෂ (මුදල්) තනතුර වර්ෂ 07 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවති තිබුණු අතර, අධ්‍යක්ෂ (නීති) හා අධ්‍යක්ෂ (ඉඩම්) යන තනතුරු ද වර්ෂ 2 ක කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. මෙකී පුරප්පාඩු සඳහා වැඩ බැලීමේ පදනමින් පත්කිරීම් සිදු කර තිබුණු අතර ඒ හේතුවෙන් ආයතනය තීරණ ගැනීමේදී බලපෑමක් සිදු වීමට ඉඩකඩ පැවතීමට හැකියාවක් පවතින බැව් නිරීක්ෂණය විය.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

## 5.1. සංයුක්ත සැලැස්ම.

-----------------------

2015 - 2019 කාලසීමාවට අදාලව පිළියෙල කල සංයුක්ත සැලැස්මෙහි 2003 ජුනි 02 දිනැති අංක PED / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව, පූර්ව වර්ෂ 3 කට අදාල මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය කර නොතිබුණි.

## 5.2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

(අ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ උපරිම සීමාව ඉක්මවා ගිය ඉඩම් හෙළිදරව් කරගැනීම, විහාර දේවාලගම් පනත අනුව ඉඩම් නිදහස් කිරීම සඳහා හඳුනා ගැනීම, කොමිසම වෙත පැවරී ඇති ඉඩම් ලියාපදිංචි කිරීම හා හිමිකම් හා ලේඛන ලියාපදිංචි කිරීම, ප්‍රධාන ගබඩාව විධිමත් ලෙස සකස් කිරීම, ප්‍රධාන ගබඩාව පරිගණකගත කිරීම සහ ඉඩම් විෂය පිළිබඳව දෛනික වැඩසටහන් පැවැත්වීම යනාදී ක්‍රියාකාරකම් කිසිවක් ඉටු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව දක්වා තිබූ ක්‍රියාකාරකම් 14 ක ඉලක්කයන්ගෙන් සියයට 50 කට අඩු ප්‍රගතියක් අත් කරගෙන තිබුණි.

## 5.3. අභ්‍යන්තර විගණනය

--------------------

අභ්‍යන්තර විගණන සැලැස්මේ දක්වා තිබූ ආදායම් අංශයෙහි ලෙජර් පැවැත්වීම සහ හිග බදු අයකර ගැනීම හා නීති අංශයෙහි උසාවි වර්ග අනුව නඩු හඳුනාගැනීම් හා වියදම් පිළිබඳ පරීක්ෂාවන් පිළිබඳ සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.4. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.5. අයවැය ලේඛනමය පාලනය

---------------------------------

සමාලෝචිත වර්ෂයේ තථ්‍ය හා අයවැය ගත ආදායම් හා වියදම් පරීක්ෂාවේදී ආදායමෙහි සියයට 34 සිට සියයට 84 ක් දක්වා සහ වියදමෙහි සියයට 30 සිට සියයට 6141 ක් දක්වාද සැලකිය යුතු විචලනයන් අනාවරනය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5.6. වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------

2013 සහ 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2016 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.7. නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

ව්‍යාජ ගනුදෙනුවක් ලෙස හඳුනාගෙන තිබූ පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීම සඳහා 2002 වර්ෂයේ ගෙවා තිබුණු රු. 17,000,000 ක මුදලක් පරිගණක අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි. මේ අනුව අත්තිකාරම් ලෙස ගිණුම් වලින් පෙන්නුම් කෙරෙන සාවද්‍ය මුදල නිරවුල් කර ගැනීමට අදාලව සභාවට ඉදිරිපත් කර සාකච්ඡා කිරීමෙන් අනතුරුව, භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බවට 2015 ජුනි 17 දිනැති විගණන කමිටුවේදී තීරණය කෙරුණි. මෙම ගිණුම් සටහන නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට විගණිත දිනය වූ 2016 අප්‍රේල් 29 දින වන විටත් නොහැකි වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විගණනයේදි නිරීක්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ආදායම් අංශය, ඉඩම් පැවරීම් අංශය, ව්‍යාපෘති අංශය ඇතුළු අනෙකුත් සියලුම අංශ ගිණුම් අංශය සමඟ සම්බන්ධීකරණය නොවීම. |
| (ආ) ණයගැති පාලනය | (i) හිඟ ආදායම් පිළිබඳ වාර්තා යාවත්කාලීන නොවීම හා හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| | (ii) රාජ්‍ය ආයතන වෙතින් සභාවට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් අදාල අංශ විසින් දැනුම් නොදීම හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි වීම |
| | (iii) අයවිය යුතු බදු මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබීම |

| | |
|---|---|
| | (iv) ණයගැති ශේෂ සනාථ ලබා නොගැනීම. |
| (ඇ) ලේඛන පවත්වා නොතිබීම | ඉඩම් ලේඛනයක් හා බදු දුන් ඉඩම්, විකිණීමෙන් පැවරී ඇති ඉඩම් සම්බන්ධ ලේඛන නොතිබීම. |
| (ඈ) ඉඩම් බදු දීම | ඉඩම් බදු දීමට අදාළව, නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. |